**මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.1,384,053 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. |
| (ආ) | රු.866,500 කට මිල දී ගත් ත්‍රිරෝද රථය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | ඉදිරියේ දි නිවැරදි කිරීමට කටයුතු කරමි. |

#### 1.3.2 නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව, ගිණුම් විෂයයන් 06 ක ශේෂය උපයෝගී ලේඛන සමඟ සැසඳීමේ දී, රු.8,265,467 ක නොසැසඳීමක් විය. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීම් කළ යුතුවේ. | වෙනස්කම් හඳුනා ගෙන නිවැරදි කරමි. |

#### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **ලැබිය යුතු ගිණුම්**<br>අවුරුදු 05 ක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.10,200,748 ක් හා අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.6,726,809 ක් විය. | ලැබිය යුතු මුදල් අය කර ගත යුතුවේ. | ඉදිරියේ දී ලැබිය යුතු මුදල් ලබා ගැනීමට කටයුතු කරමි. |

(ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u>

| | | |
|---|---|---|
| අවුරුදු 05 ක කාලයක් ඉක්ම වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.1,237,331 ක් වූ අතර, අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.5,975,871 ක් විය. | ගෙවිය යුතු මුදල් නිරවුල් කළ යුතුවේ. | ඉදිරියේ දී නිරවුල් කිරීම සඳහා කටයුතු කරමි. |

**1.3.4** <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම තොරතුරු ඉදිරිපත් නොකිරීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.5,905,919 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් සම්බන්ධයෙන් ලේඛන හා ලිපිගොනු ආදිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූලා‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.5** <u>අනුකූල නොවීම</u>

**1.2.5.1** <u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මු.රෙ. 1645 | වාහන සම්බන්ධයෙන් පවත්වා ගෙන යනු ලබන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දි නිවැරදිව යාවත්කාලීන කරමි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3.1 වගන්තිය | වාහන 09 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාළ පරීක්ෂණයන් සිදු කිරීමට කටයුතු කරමි. |

### 1.3.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මධ්‍යම පළාත් පිවිතුරු හරිත සංවර්ධන වැඩසටහන යටතේ පේරාදෙණිය සති පොල සංවර්ධනය කිරීමට අදාළ ඇස්තමේන්තුවේ සඳහන් රු.1,381,250 ක් වූ කාර්යයන් අත්හිටුවා තිබිය දී, සභාව විසින් එම කාර්යයන් නිම කර, සභා අරමුදලින් රු.1,700,000 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | අදාළ ප්‍රතිපාදන යටතේ ගෙවීම් සිදු කළ යුතුවේ. | ප්‍රධාන ලේකම් කාර්යාලය වැඩ අත්හිටුවීමට උපදෙස් දෙන විට කර්මාන්තය ආරම්භ කර තිබූ බැවින්, ගෙවීම් කිරීමට සිදු වූ බව ප්‍රකාශ කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.30,704,703 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.70,052,176 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,454,709 | 2,363,786 | 2,287,868 | 4,355,086 | 6,117,000 | 2,917,135 | 2,992,084 | 2,405,485 |
| (ii) | කුලී | 5,694,561 | 4,027,193 | 3,912,775 | 2,289,560 | 3,703,200 | 3,647,760 | 3,203,395 | 2,177,225 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,352,750 | 2,027,068 | 1,964,668 | 312,000 | 1,955,100 | 1,856,875 | 1,687,675 | -- |
| (iv) | වෙනත් ආදායම් | 33,985,750 | 29,172,637 | 76,273,568 | 6,215,168 | 37,857,500 | 32,685,098 | 12,686,564 | 53,268,554 |
| | එකතුව | 44,487,770 | 37,590,684 | 84,438,879 | 13,171,814 | 49,632,800 | 41,106,868 | 20,569,718 | 57,851,264 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.436,658 ක් හා මුද්දර ගාස්තු රු.57,124,480 ක් විය. | ලැබිය යුතු මුදල් ගෙන්වා ගත යුතුවේ. | උපලේඛන ලැබෙමින් පවතින අතර, මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට කාරණා 06 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථා සම්පාදන කමිටු පිහිටුවා අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට සහ පනවා ගැනීමට කටයුතු කරමි. |

(ආ) ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ කාර්යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ පොලිතීන් සක්‍රීය කිරීමේ ව්‍යාපෘතිය හා කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම සඳහා වෙන් කර තිබූ රු.52,000,000 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | ප්‍රතිපාදන අරමුණු වෙනුවෙන් උපයෝජනය කළ යුතුවේ. | ඉඩමක් තෝරා ගෙන ඇති නමුත්, මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම ඉඩම අදාළ කාර්යය සඳහා නුසුදුසු බව දන්වා ඇත. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.2,876,250 ක් වූ ක්‍රීඩා උපකරණ පවතින ශරීර සුවතා මධ්‍යස්ථානයේ පුහුණු කටයුතු සම්බන්ධව වගකීම විධිමත් ගිවිසුමකින් තොරව 2019 අප්‍රේල් සිට නොවැම්බර් දක්වා පුද්ගලයෙකුට පවරා තිබුණි. | වත්කම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභාවට යොමු කර ඉදිරි පියවර ගැනීමට කටයුතු කරමි. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| 2019 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව තුළ පුරප්පාඩු 08 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුවේ. | වර්තමානයේ බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින්, මෙම පුරප්පාඩු පවතී. |

**3.4 <u>වත්කම් කළමනාකරණය</u>**

**3.4.1 <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වටිනාකම හඳුනාගත නොහැකි ධූමායන යන්ත්‍රයක් සහ වල් කපන යන්ත්‍රයක් නිෂ්ක්‍රීයව පැවතුණි. | වත්කම් නිෂ්කාර්යව නොතබා ප්‍රයෝජනයට ගත යුතුවේ. | මිල තක්සේරු කර ගැනීම සඳහා යාන්ත්‍රික ඉංජිනේරු වෙත යොමු කර ඇති අතර, අදාළ විස්තර ලද පසු ඉදිරි ක්‍රියාමාර්ග ගනිමි. |
| (ආ) | වටිනාකම රු.480,000 ක් වූ ජීව වායු ඒකකය වර්ෂ 05 ක කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි. | වත්කම් ප්‍රයෝජනයට ගත යුතුවේ. | ජීව වායු ඒකකය පිළිබඳව අදාළ ආයතනය සමඟ සම්බන්ධ වී ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර, ඉදිරි කටයුතු සිදු කරමි. |

**3.5 <u>ප්‍රසම්පාදනය</u>**

**3.5.1 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පල්ලේගම ගහහවෙල මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා භාවිතා කළ ඇතුරුම් ගල් සඳහා (Payment for Paving Blocks) පිරිවිතරයන්ට අනුකූලව පැවතිය යුතු සම්පිණ්ඩණ ශක්තිය (Comprehensive Strength) නොමැති බව තත්ත්ව පරීක්ෂණ වාර්තා මඟින් තහවුරු වී තිබිය දී, ඇතුරුම් ගල් වර්ග මීටර් 85.07 ක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු.242,109 ක් ගෙවීම් කර තිබුණි. | ගෙවීම් සිදු කිරීමට පෙර නියමිත ගුණත්ත්වය පිළිබඳ පරීක්ෂා කළ යුතුවේ. | නැවත තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරමි. |

**4. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>**

**<u>නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොලත් විගණන විමසුම්</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 – 3.5.1<br>නිරවුල් කර නොගත් රු.28,764,697 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි 25 ක් සභාව සතුව පැවතුණි. | වත්කම් නිරවුල් කර ගත යුතුවේ. | වත්කම් සමීක්ෂණ ආරම්භ කර ඇති අතර, එය අවසන් වූ පසු අදාළ ක්‍රියාමාර්ග ගනිමි. |

(ආ) 2018 – 3.5.2(ආ)

---------------------

| | | |
|---|---|---|
| 2010 වර්ෂයේ සිට වටිනාකම හඳුනාගත නොහැකි ජල උපකරණ අයිතම 147 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන විනාශ වීමට ඉඩ හැර පැවතුණි. | වත්කම් මගින් උපරිම ප්‍රයෝජන ගත යුතුවේ. | වෙන්දේසි කිරීම සඳහා මහා සභා සම්මුතියක් ලැබී ඇත. |

(ඇ) 2018 – 3.6

--------------

| | | |
|---|---|---|
| සභාව විසින් විවිධ කාර්යයන් සඳහා වෙනත් ආයතනවල තැන්පත් කර තිබූ, රු.276,693 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලබා ගත යුතු මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අදාළ ආයතන සමඟ සම්බන්ධ වී විසඳා ගැනීමට කටයුතු කරමි. |